මාධ්‍ය නිවේදනය

**කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ විදේශ අමාත්‍යාංශයේ කොන්සියුලර් සේවා ඉටු කිරීම**

හඳුන්වා දී ඇති සෞඛ්‍ය ආරක්ෂණ පියවරයන්ට අනුකූලව සාමාන්‍ය ජනතාවට අඛණ්ඩ කාර්යක්ෂම සේවාවක් ලබා දීම සහතික කිරීම සඳහා, 2020 නොවැම්බර් 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අනිවාර්යයෙන් ම කලින් වේලාව වෙන්කර ගැනීමේ පදනම මත දිනකට සීමිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් සඳහා අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශය විසින් සපයනු ලබන ලේඛන සහතික කිරීමේ සේවා නැවත ආරම්භ කිරීමට විදේශ අමාත්‍යාංශය තීරණය කර තිබේ.

ඒ අනුව, කොන්සියුලර් කටයුතු අංශයට පැමිණීමට පෙර පහත සඳහන් වෙබ් දිගුව හෝ දුරකථන අංකය හරහා හමුවීම සඳහා වේලාවක් වෙන් කර ගත යුතු වන අතර, එසේ වේලාවන් වෙන්කර ගත හැක්කේ සතියේ වැඩ කරන දිනවල උදේ 10.00 සිට ප.ව 2.00 දක්වා පමණි:

වෙබ් දිගුව: http://consular.mfa.gov.lk/ONLINEBOOKING

දුරකථන: +94112338812

**මේ ආකාරයට කලින් වේලාව වෙන්කර නොගත් පුද්ගලයින්ට කොළඹ 01 සෙලින්කෝ ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීමට ඉඩ ලබා නොදෙන අතර, හුදෙකලා කොට ඇති/ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල පුද්ගලයින් මෙම කාලය තුළ දී කාර්යාලයට පැමිණීමෙන් වැළකී සිටිය යුතුය.**

විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින්ගේ මරණය, වන්දි ගෙවීම්, නැවත මෙරටට ගෙන්වා ගැනීම සහ වෙනත් කාරණා සම්බන්ධ විමසුම් සඳහා කරුණාකර පහත සඳහන් අංක අමතන්න.

ෆැක්ස්: +94112473899 විද්‍යුත් තැපැල: consular@mfa.gov.lk

| අංශය | දුරකථන අංකය |
|---|---|
| මරණ | +94112338836, +94113136715<br>+94776032252, +94773586433<br>+94718415623, +94701428246 |
| වන්දි | +94112437635 +94117101193 |
| නැවත මෙරටට ගෙන්වා ගැනීම | +94112338837 |
| විවිධ | +94112338843 +94117101162 |

මාතර සහ යාපනයේ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල දෙකම සතියේ වැඩකරන දිනවල දී සාමාන්‍ය ජනතාව සඳහා විවෘත කරන බව කරුණාවෙන් සලකන්න. කරුණාකර පහත දුරකථන අංක හරහා කලින් වේලාවක් වෙන් කර ගන්න:

මාතර ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය: +94412226697
යාපනය ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලය: +94212215972

විදේශ අමාත්‍යාංශය
කොළඹ

2020 නොවැම්බර් 09 වැනි දින